කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි.
Issued by Forecasting Division, National Meteorological Centre.

---

**2020 ඔක්තෝබර් මස 12 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2020 ඔක්තෝබර් මස 11 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

බස්නාහිර, සබරගමුව, මධ්‍යම සහ වයඹ පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. සබරගමුව සහ මධ්‍යම පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ප්‍රදේශවලට මි.මී. 75 ට වැඩි තරමක තද වැසි ද ඇතිවිය හැක.

උතුරු පළාතේ සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැසි ස්වල්පයක් ඇති විය හැක.
නැගෙනහිර සහ ඌව පළාත්වල සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

දිවයින හරහා, විශේෂයෙන්ම උතුරු, උතුරු-මැද සහ වයඹ පළාත්වලත් ත්‍රිකුණාමලය සහ හම්බන්තොට දිස්ත්‍රික්කවලත් මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශවලත් විටින් විට හමන පැ.කි.මී (50-60) පමණ තද සුළං ඇතිවිය හැක.

## WEATHER FORECAST FOR 12 OCTOBER 2020
**Issued at 12.00 noon on 11 October 2020**

Showers or thundershowers will occur at times in Western, Sabaragamuwa, Central and North-western provinces and in Galle and Matara districts. Fairly heavy rainfalls exceeding 75mm are likely at some places in Sabaragamuwa and Central provinces and in Galle and Matara districts.

A few showers may occur in Northen province and Anuradhapura district.

Showers or thundershowers may occur at a few places in Eastern and Uva provinces in the afternoon or night.

Strong gusty winds about **(50-60) kmph** can be expected across the island, particularly in the Northern, North-central and North-western provinces, Trincomalee and Hambanthota districts and in the western slopes of the central hills.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය

## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
2020 ඔක්තෝබර් මස 11 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.

**විශේෂ නිවේදනය**

උතුරු අන්දමන් මුහුද සහ ආසන්න නැගෙනහිර-මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති අඩු පීඩන කලාපය, පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී, මේ වනවිට උතුරු අක්ෂාංශ 15.3ත් නැගෙනහිර දේශාංශ 86.5 ආසන්නයේ පිහිටා ඇත. එය ඉදිරි පැය 24 තුළ ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වෙමින් බස්නාහිර දිශාවට බරව වයඹ දිශාවට ගමන් කරමින්, හෙට (12) දින සවස් කාලයේ දී ඉන්දියාවේ උතුරු අන්ද්‍රා ප්‍රදේශ් වෙරළ හරහා ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.

ඉදිරි දින කිහිපයේදී, නැගෙනහිර-මධ්‍යම බෙංගාල බොක්ක සහ උතුරු අන්දමන් මුහුදු ප්‍රදේශවල (13N-18N, 80E-93E) තද හෝ ඉතා තද ප්‍රහාරාත්මක සුළං, තද වැසි සහ රළු හෝ ඉතා රළු මුහුදු ප්‍රදේශ ඇතිවිය හැක.

ඉහත සඳහන් කරනලද ගැඹුරු මුහුදු ප්‍රදේශ වෙත, ඔක්තෝබර් මස 14 දින දක්වා යාත්‍රා කිරීමෙන් වළකින ලෙස ධීවර සහ නාවුක ප්‍රජාව වෙත දැනුම් දෙනු ලැබේ.

තවද, ඔක්තෝබර් මස 12 වන දින දක්වා ගාල්ල සිට මාතර සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල ධීවර කටයුතුවල යෙදීම අනතුරුදායක වන අතර ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිලිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

**වැසි තත්ත්වය:**

කන්කසන්තුරය සිට මන්නාරම, පුත්තලම, කොළඹ, ගාල්ල සහ මාතර හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශ වල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං බස්නාහිර සිට නිරිත දක්වා වන දිශාවලින් හමයි. සුළගේ වේගය පැ.කි.මී. (35-45) පමණ වේ.
ගාල්ල සිට මාතර සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (60-70) දක්වා වැඩි විය හැක. කන්කසන්තුරේ සිට මන්නාරම හරහා පුත්තලම දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (55-65) දක්වා වැඩි විය හැක. සෙසු මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (50-55) දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

ගාල්ල සිට මාතර සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු හෝ ඉතා රළු විය හැක. කන්කසන්තුරේ සිට මන්නාරම හරහා පුත්තලම දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු හෝ රළු විය හැක. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ තරමක් රළු වේ.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
## Issued at 12.00 noon on 11 October 2020

**Special notice**

**The low pressure was in the North Andaman Sea and adjoining East-central of Bengal sea area has intensified into a depression and located near latitude 15.3N, longitude 86.5E. It is very likely to intensify into a deep depression during next 24 hours. It is likely to move West-northwestwards and cross North Andra pradesh (India) coast tomorrow(12th) evening.**

**Strong or very strong gusty winds, heavy rainfalls and rough or very rough seas can be expected over north of Andaman sea and East-central Bay of Bengal Sea area (13N-18N, 80E-93E) during subsequent days from today.**

**Naval and fishing communities are advised not to venture into aforementioned deep sea areas until 14th Ocotber 2020.**

**Ferthermore, Fishermen are informed that it will be dangerous to venture into the sea areas extending from Galle to Pottuvil via Matara and Hambanthota until 12th October 2020 and naval and fishing communities are requested to be vigilant in this regard.**

**Condition of Rain:**

Showers or thundershowers will occur in the sea areas from Kankasanthurei to Hambantota via Mannar, Puttalam, Colombo, Galle and Matara.

**Winds:**

Winds will be Westerly to South-westerly in the sea areas around the island and the wind speed will be **(35-45) kmph**.
Wind speed can increase up to **(60-70) kmph** in the sea areas extending from Galle to Pottuvil via Matara and Hambanthota and increase up to **(55-65) kmph** in the sea areas off the coast extending from Kankasanturai to Puttalam via Mannar. Wind speed can increase up to **(50-55) kmph** in the other sea areas as well.

**State of Sea:**

The sea areas extending from Galle to Pottuvil via Matara and Hambanthota can be rough or very rough at times. The sea areas extending from Kankasanturai to Puttalam via Mannar, can be fairly rough or rough at times. Other sea areas around the island will be fairly rough at times.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි